රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක : 384

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ -07 .
1987 ඔක්තෝබර් මස 29 වැනි දින .

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත .

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ II ශ්‍රේණිය හා II පන්තියේ I ශ්‍රේණිය ඒකාබද්ධ කිරීම .**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ II ශ්‍රේණිය , II පන්තියේ I ශ්‍රේණිය හා ඒකාබද්ධ කිරීමට රජය තීරණය කර ඇත. එම නිසා පහත සඳහන් කරුණු සපුරාලන නිලධාරීන් II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමට සලකා බැලීම සඳහා අයදුම් පත් මා වෙත ඉදිරිපත් කරනු මැනවි .

1. 1987.07.27 දින වන විට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ අවු: 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති , පහත දැක්වෙන සුදුසුකම් සපුරාලන , සේවයේ ස්ථිර කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ I ශ්‍රේණියට 87.07.27 දින සිට හෝ නියමිත සුදුසුකම් සපුරා ලන දිනයේ සිට හෝ උසස් කරනු ලැබේ .

   අ. I වන හා II කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්ව ඇති හෝ නිදහස් කර තිබීම .

   ආ දෙවන භාෂාව සමත්ව හෝ නිදහස් කරවා ගෙන තිබීම .

   ඇ 1986 ජුනි 02 දින හෝ ඊට පසු සේවයට පත් කරන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II වන පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු සම්බන්ධයෙන් පමණක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පවත්වන ගණකාධිකරණ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම

   ඈ උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 05 ක කාලයක් තුළ නියමිත දිනයන්හි දී වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම

   ඉ උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 5 ක කාල සීමාවත් තුළ කර ඇති වරදක් සඳහා විනයානුකූල දඬුවමකට භාජනය නොවී තිබීම හෝ විනයානුකූල පරීක්ෂණයක් ආරම්භ හෝ ඇරඹීමට කටයුතු කර හෝ නොතිබීම.

2../

2. I ජේදයේ සුදුසුකම් සපුරාලන නිලධාරීන්ගේ ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් තම නිර්දේශයන් ද සහිතව අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ මාර්ගයෙන් මා වෙත ඉදිරිපත් කළ යුතුය . එවිට II පන්තියේ I ශ්‍රේණියට උසස් කර ඊට අදාළ වැටුප් පියවරේ තබන්නෙමි .

3. 1987.07.28 දිනට හෝ ඉන්පසු දිනකට අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ඉහත I ජේදයේ දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් අදාළ ලේකම්ගේ නිර්දේශය සමග මා වෙත ඉදිරිපත් කළ යුතුය .

4. II පන්තියේ I ශ්‍රේණිය සඳහා උසස් කිරීම පිණිස ඉල්ලුම් පත මීට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුයි .

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන),
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය .

ර/23